**ජාතික යොවුන් සේනාංකය - 2019**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කල මතය

ජාතික යොවුන් සේනාංකයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික යොවුන් සේනාංකය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සේනාංකය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සේනාංකයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සේනාංකය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණය කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු අතර වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.3 - ගිණුම්කරණ ප්‍රමිතයේ සඳහන් නියමයන්ට අනුව සංශෝධනය කර මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කල වුවත් 2019 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.400,719,690 ක්වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයේ වත්කම් සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව මෙම වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුවශයෙන් සෑම වර්ෂයක් පාසාම වෙනස් වන ආකාරය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස ලෙස ගිණුම් ගත කල යුතු බව පිළිගනිමි. 2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින විට රු. 400,719,690/- ක් වටිනා සම්පූර්ණයෙන්ම ක්ෂය වත්කම් තවදුරටත් පැවැති අතර, ඉදිරියේදී එය ගිණුම්කරණ ප්‍රමිත අනුව සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 (ඊ) ඡේදය ප්‍රකාරව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් සටහන් හා අනෙකුත් විස්තරාත්මක සටහන් මූල්‍ය ප්රකාශන තුළ ඇතුළත් කළ යුතු වුවද සේනාංකය විසින් ආදායම්, වියදම්, රාජ්‍ය ප්‍රදාන ලැබීම්, කෙටිකාලීන ආයෝජන, ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂ සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් වලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල මෙම ගිණුම් කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික වෙන් කිරීම රු.22,466,917 ක් වුවද නිවැරදි පාරිතෝෂික වෙන් කිරීම රු.25,644,220 ක් වූයෙන් පාරිතෝෂික වෙන්කිරීමේ ශේෂය රු. 3,177,303 ක් අඩුවෙන් හා පාරිතෝෂික වියදම රු. 3,177,303 ක් අඩුවෙන් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා වර්ෂයේ ඌනතාවය ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික වියදම රු.3,177,303 ක් වැඩියෙන් දක්වා තිබූ වරද 2021 වර්ෂයේ වාර්ෂික ගිණුම්හි නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අ) මූල්‍ය ප්‍රකාශනවල රු.19,538,108 ක් වූ වෙනත් ලැබිය යුතු දෑ වල ඇතුළත් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලැබිය යුතු රු. 11,172,664 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටද අයකර නොගෙන පැවතුණි. | මෙම වර්ෂයන් සඳහා ගෙවීම් කිරීමට ප්‍රතිපාදන නොමැති බැවින් ඒ පිළිබඳ ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡාවට ලක් කිරීමට කටයුතු යොදා ඇත. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| ආ) සේනාංකයෙන් පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2015 සිට 2020 දක්වා පරිහරණය කරන ලද විදුලිය හා ජල පරිහරණයට අදාළව හා වරිපනම් වෙනුවෙන් අයවිය යුතුව පැවති රු.13,653,116 ක් 2021 ජනවාරි 19 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පසුගිය වර්ෂයන් සඳහා වූ වටිනාකම් සඳහා ගනු ලබන පියවර පිළිබඳව කුඩා ව්‍යාපාර අංශය වෙත ලිඛිතව දැනුවත් කිරීමක් සිදු කරන ලදී. | අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම |

### 1.6.2. ගෙවිය යුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල රු.61,948,023 ක් වූ අනිකුත් ගෙවිය යුතු වටිනාකම තුල ඇතුළත් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු වගකීම් රු.13,262,791 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් නොකර පැවතුණි. | අනෙකුත් ගෙවිය යුතු රු. 61,948,023 ක අගයෙන් මේ වන විට නිරවුල් කර ඇති හා නිරවුල් කිරීම ගැටලු සහගත වූ වටිනාකම් පිළිබඳ විස්තරයක් කඩිනමින් ඉදිරිපත් කරමි. | ගෙවිය යුතු මුදල් නොපමාව ගෙවා නිරවුල් කිරීමටද, වගකීමක් නොමැති ගෙවිය යුතු ශේෂයන් තිබේ නම් එම ශේෂයන් ආදායමට ලියා ගැනීමටද කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය | සේනාංකය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2015, 2016 හා 2017 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා සකස් කර 2021.11.03 දින පාර්ලිමේන්තුවේ සභා ගත කරන ලදී. 2018 හා 2019 වාර්ෂික වාර්තාවන්ද මේ වි විට කොටුම්පත් කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව සංයුක්ත සැලසුම් පිළියෙල කල යුතු වීම. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.63,528,090 ඌනතාවයක් වූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 56,160,946 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.119,689,036 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් ආදායම රු. 74,029,352 කින් අඩුවීම හා සංවර්ධන වියදම් රු.59,344,076 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුහුණු මධ්‍යස්ථාන 49 ක 2019 වර්ෂයේ පළමු කණ්ඩායම සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා සිසුන් 6,941 ක් බඳවා ගෙන තිබුණ අතර එයින් සිසුන් 4,784 ක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි. බඳවා ගත් සිසුන්ගෙන් 2,157 ක් එනම් සියයට 31 ක් පාඨමාලාව හැර ගොස් තිබුණි. පුහුණු මධ්‍යස්ථාන 56 ක 2019 වර්ෂයේ දෙවන කණ්ඩායම සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා සිසුන් 3,882 ක් බඳවා ගෙන තිබුණ අතර එයින් සිසුන් 2,426 ක් පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි. බඳවාගත් සිසුන්ගෙන් 1,456 ක් එනම් සියයට 38 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. පුහුණු හා සංවර්ධන අංශයේ 2019 වර්ෂය තුළ විවිධ වැඩසටහන් දහයක් සඳහා සහභාගී කරවීමට අපේක්ෂා කළ සිසුන් සංඛ්‍යාව 45,510 ක් වුවද ඒ සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 16,727 | 2019 වර්ෂයේ පාඨමාලා හැරයාමේ සංඛ්‍යාව ඉදිරියේදී අවම කර ගැනීම සඳහා පිළිගත් සහතිකපත්‍රයක් ලබා දීම, ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ සහ ජාතික මට්ටමේ පවත්වන කලා තරඟ හරහා වෘත්තීය මට්ටමේ ක්‍රීඩකයින් හා කලකරුවන් බිහි කිරීමට කටයුතු කිරීම තුලින් පාඨමාලාවේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම හරහා පාඨමාලාව හැරයන යෞවන / යෞවනියන්ගේ ප්‍රමාණය අඩු කර ගැනීමට කටයුතු කර ඇත. | සිසුන්ගේ කාර්යසාධනය උපරිම වන පරිදි පාඨමාලා කළමනාකරණය කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ක් වූ අතර සහභාගී නොවූ සංඛ්‍යාව 28,783 කි. ඒ අනුව එකිනෙක පුහුණු වැඩසටහන් සඳහා සහභාගී නොවූ ප්‍රතිශතය සියයට 50 සිට 79 දක්වා පරාසයක පැවතුණි. | | |
| (ආ) 2019 වර්ෂයේ පලමු කණ්ඩායමම සඳහා පුහුණු මධ්‍යස්ථාන 49 ක් පැවති අතර එහි පන්ති කාමර ධාරිතාවය සිසුන් 7825 ක් විය. පුහුණු මධ්‍යස්ථාන 16 ක් සඳහා පන්ති කාමර ධාරිතාවය ඉක්මවා සිසුන් ලියාපදිංචි කරගෙන තිබුණ අතර මධ්‍යස්ථාන 33 ක ලියාපදිංචි කරගෙන තිබුණු සිසුන් සංඛ්‍යාව ධාරිතාවයට වඩා පහල මට්ටමක පැවතුණි. 2019 වර්ෂයේ දෙවන කණ්ඩායමම සඳහා පුහුණු මධ්‍යස්ථාන 56 ක් පැවති අතර එහි පන්ති කාමර ධාරිතාවය වූ සිසුන් 9105 ක් සඳහා සිසුන් 3882 ක් බඳවා ගෙන තිබුණු අතර ලියාපදිංචි වූ සිසුන් ප්‍රමාණය සියළුම මධ්‍යස්ථානවල ධාරිතාවයට වඩා පහළ මට්ටමක පැවතුණි. දඹුල්ල හෝටල් පාසලේ පන්ති කාමර ධාරිතාවය සිසුන් 200 ක් වුවද, 2019 වර්ෂයේ පළමු හා දෙවන කණ්ඩායම් සඳහා බඳවාගත් සිසුන් ප්‍රමාණය පිළිවෙළින් සිසුන් 103 ක් හා 97 ක් වී තිබුණු අතර යක්කල ව්‍යාපාර බාහිර කරන ආයතනයේ (IBPO) පන්ති කාමර ධාරිතාවය සිසුන් 60 ක් වුවද, 2019 -1 හා 2019 – 11 කණ්ඩායම් සඳහා බඳවාගත් සිසුන් ප්‍රමාණය පිළිවෙළින් සිසුන් 37 ක් හා 08 ක් වී තිබුණු අතර ඒ අනුව පන්ති කාමර ධාරිතාවය ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය. | පුහුණු මධ්‍යස්ථාන සඳහා පවතින පහසුකම් හා මධ්‍යස්ථාන පිහිටීම අනුව යෞවන යෞවනියන් අතර වැඩි ඉල්ලුමක් ඇතැම් මධ්‍යස්ථාන සඳහා පවතී. එම මධ්‍යස්ථාන සඳහා පවතින ඉල්ලුම මත ඇතැම් මධ්‍යස්ථාන වල ධාරිතාව ඉක්මවා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර ඇති බව පෙන්වා දෙමි. | -එම - |
| (ඇ) යොවුන් සේනාංකයේ මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති ඉඩම්වල 2019 දෙසැම්බර් 31 දිනට සේනාංකය විසින් ප්‍රාදේශීයව පුහුණු මධ්‍යස්ථාන 56 ක් පවත්වා ගෙන ගොස් තිබූ අතර එම මධ්‍යස්ථානවලට අදාලව ඉඩම් සංඛ්‍යාව 58 කි.<br>සේනාංකය ආරම්භ කිරිමේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව ඇතුළු රජයේ හිස් ඉඩම් හා ගොඩනැගිලි සහිත ඉඩම් ලබාගෙන පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර තිබුණි. මධ්‍යස්ථාන 18 ඉඩම් පවරා ගැනීම් කටයුතු අවසන්ව ඇතත් ඉතිරි මධ්‍යස්ථාන 26 කට අදාළ ඉඩම් පවරා ගැනීම් කටයුතු මෙතෙක් නිම වී නොතිබුණි.<br>නුවරඑළියේ ජාතික තරුණ සේවා සභාවට | යොවුන් සේනාංකය ආරම්භයේදී ප්‍රාදේශීය ලේකම්වරු (රජය), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව ආදී ආයතන භාරයේ තිබූ හිස් ඉඩම් මෙන්ම ගොඩනැගිලිද සහිත ඉඩම් ලබා ගෙන යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කරන ලද අතර එම ඉඩම් හා ගොඩනැගිලි එම අවස්ථාවේදී විධිමත්ව පවරා ගැනීමක් සිදු කර නොමැත. මේ වන විට මෙම ඉඩම් විධිමත්ව පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | විධිමත් පරිදි ඉඩම් පවරා ගැනීමට කටයුතු කිරීම සහ වත්කම් කළමනාකරණය කාර්යක්ෂම ලෙස කළ යුතු වීම. |

අයත් ගොඩනැගිල්ලක් පවරා ගැනීමක් හෝ කුලී ගෙවීමකින් තොරවද, ත්‍රිකුණාමලයේ රජයේ පාසැලකද පුහුණු මධ්‍යස්ථාන ලෙස කටයුතු පවත්වා ගෙන ගොස් තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 අගෝස්තු 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව (NEMO) ජාතික උපකරණ සහ යන්ත්‍රෝපකරණ සංවිධානය වෙත යොවුන් සේනාංකයේ ඉදිකිරීම් විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව ලබා දී තිබුණි. ඉදිකිරීම් ප්‍රගතියේ අසාර්ථකත්වය මත 2020 පෙබරවාරි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම කොන්ත්‍රාත් අවලංගු කිරීමටත්, කල වැඩ හා ගෙවූ මුදල අතර වෙනස අයකර ගැනීමට නීතිමය පියවර ගැනීමටත්, සියයට 50 ට වැඩි ප්‍රගති ඉදිකිරීම් අදාළ උප කොන්ත්‍රාත්කරුවන්ට ලබා දීමටත්, සියයට 50 ට අඩු ප්‍රගති ඉදිකිරීම් යලි ටෙන්ඩර් කිරීමටත් අනුමැතිය ලබාදී තිබුණි. 2022 මැයි 30 දින වන විටද සියයට 50 ට අඩු ප්‍රගති ව්‍යාපෘති යලි ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබුණු බව හා NEMO ආයතනයෙන් අයවිය යුතු මුදල ගණනය කිරීමක්ද සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | මෙම ඉදිකිරීම් අතුරින් සියයට 50 ට වඩා වැඩි ප්‍රතිශතයක් ඇති ඉදිකිරීම් උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දීමේ තීරණය අනුව මධ්‍යස්ථාන 05 ක ගොඩනැගිලි ඒකක 06 ක ඉදිකිරීම් සඳහා 2020/12/28 දින උපකොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදී. තවද 2021 වසරට වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුල ගොඩනැගිලි ඒකක 06 ක් උපකොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කර ඇත. සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයක් ඇති ව්‍යාපෘතින්හි ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර දෙන ලෙසට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇති අතර, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙතින් අය විය යුතු මුදල් ගණනය කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ජාතික යොවුන් සේනාංකයට ලබා දෙන ලෙස ද එම ආයතනය වෙත දැනුම් දීම් දී ඇත. | සේනාංකයේ අරමුණු සහ කාර්යසාධනය උපරිම වන අයුරින් කොන්ත්‍රාත් කළමනාකරණය කාර්යක්ෂමව සිදු කළ යුතු වීම. |
| (ආ) 2017 වර්ෂයේදී රු.6,650,000 ක් අගයකට ත්‍රී රෝද රථ 10 ක් මිලදී ගෙන තිබුණු අතර, එම ත්‍රි රෝද රථ ලබා දීමට යෝජිත මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් වෙනත් මධ්‍යස්ථානවල ගාල්කර තබා තිබුණි. මෙතෙක් එම මධ්‍යස්ථානවල ඉදිකිරීම් නිම නොකිරීම හේතුවෙන් එම මධ්‍යස්ථාන ආරම්භ කර නොතිබුණු අතර එම ත්‍රිරෝද රථ 2022 වර්ෂයේ මෙතෙක් පලාත් | 2018 වර්ෂයේදී මෙම සියලුම මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ පදනම මත හා එලෙස ආරම්භ කරන මධ්‍යස්ථාන සියල්ලම සඳහා ත්‍රී රෝද රථ ලබා දීමේ අවශ්‍යතාවය පදනම් කර ගනිමින් එම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ප්‍රතිපාද මත යැපෙමින් 2017 වර්ෂයේ දෙසැම්බර් මස ත්‍රී රෝද රථ මිලදී ගන්නා ලදී. ඉන් අනතුරුව අළුතින් ආරම්භ කරන මධ්‍යස්ථාන ප්‍රමුඛතාවය මත ඒ ඒ මධ්‍යස්ථාන සඳහා ත්‍රී රෝද රථ ලබා දීමද සිදු විය. එහෙත් | සේනාංකයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා කළමනාකරණ කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| කාර්යාල වෙත ලබා දී තිබුණි | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ඉදිකිරීම් කටයුතු අතිශයින් ප්‍රමාද වීම හේතුවෙන් මෙලෙස විගණිත දිනය වන විටත් ආරම්භ කිරීමට නියමිත මධ්‍යස්ථාන සඳහා ලබා දීමට නියමිත ත්‍රී රෝද රථ එම මධ්‍යස්ථාන අයත්වන පළාතේ ආසන්නතම මධ්‍යස්ථානයේ ගාල් කර තැබීමට සිදු වූ බව පිළිගනිමි. | |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලයේ භාවිතා කරනු ලබන වාහන 09 න් වාහන 07 ක අයිතිය සේනාංකය සතු නොවුවද එම වාහන සේනාංකයේ නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ධාවනයෙන් ඉවත් කරන ලද සහ අපහරණ කළ යුතු වාහන 03 ක් 2021 ජනවාරි 19 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අපහරණ කටයුතු 2021 වර්ෂයේදී සිදු කර අවසන් විය | වාහන පවරා ගැනීම සහ වත්කම් අපහරණ කටයුතු අප්‍රමාදව සිදු කළ යුතු වීම. |

## 3.4 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ සංවර්ධන සහකාර තනතුර හා කළමනාකරණ තනතුරු පිළිවෙලින් 87 ක් හා 11 ක් බැගින් පුරප්පාඩු පැවතුණි. තවද, සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන සඳහා අනුමත දෙමළ භාෂාව, තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂා උපදේශකවරු පිළිවෙලින් 57 ක්, 59 හා 58 ක් වුවද ස්ථිර තනතුරු ලෙස පවතිනුයේ 10 ක්, 39 ක් හා 35 ක් පමණක් වන අතර කොන්ත්‍රාත් පදනම මත දෙමළ භාෂා උපදේශකවරු 15 ක් හා ඉංග්‍රීසි භාෂා උපදේශකවරු 04 ක්ද බඳවාගෙන තිබුණි. ඒ අනුව දෙමළ, තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රීසි උපදේශකවරු පිළිවෙළින් 32 ක් 20 ක් හා 19 ක් පුරප්පාඩු පැවතුණි. | සේනාංකය සඳහා ස්ථිර පදනම මත සේවකයින් බඳවා ගනු ලැබුවද සේනාංකයෙන් ලබා ගන්නා පත්වීම් විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන හෙයින්ද, දිවයින පුර මධ්‍යස්ථාන පිහිටුවා ඇති බැවින්ද රජයේ ස්ථිර විශ්‍රාම වැටුප් ලැබෙන රැකියාවන් සඳහා ඔවුන් අයැදුම් කර ඒ සඳහා යොමු වීමේ වැඩි ප්‍රවණතාවයක් පැවතීම මෙම පුරප්පාඩු පැවතීමට හේතු වේ. | පුරප්පාඩු තනතුරු අප්‍රමාදව සම්පූර්ණ කිරීමට කටයුතු කර සේනාංකයේ මානව සම්පත් කළමනාකරණය කාර්යක්ෂමව සිදු කළ යුතු වීම. |